ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2017 පෙබරවාරි 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 ජනවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 ජනවාරි මාසයේ වාර්ෂික උද්ධමනය 6.5%ක් ලෙස ගණනය කර ඇති බව ප්‍රකාශ කලේය. 2016 දෙසැම්බර් මාසයේ උද්ධමනය 4.2%ක් විය. 2016 ජනවාරි මාසයේ මිල ගණන් සංසන්දනාත්මකව පහළ මට්ටමක පැවතීම උද්ධමනය ඉහළ යාමට හේතුවක් විය. 2016 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ දායකත්වය -1.9%ක් සහ ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.2%ක් විය. එහෙත් 2017 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 2.9%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2017 ජනවාරි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 119.3ක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2017 ජනවාරි මාසයේ දර්ශකය 2016 දෙසැම්බර් මාසයේ දර්ශකය (118.0) හා සංසන්දනය කල විට 1.3ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.78%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.35%කින් වැඩිවීම බලපා ඇත.

2016 දෙසැම්බර් මාසය හා සසඳන කල 2017 ජනවාරි මාසයේ ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා සහල්, පොල්, කෙසෙල්, පොල්තෙල්, අමු මිරිස්, සීනි, අළුත් මාළු, පැපොල්, කරවල, අර්තාපල්, සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් එළවළු, දෙහි, කුකුල් මස්, බිත්තර, ලොකුළූණු, රතුළූණු, අඹ සහ වියළි මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'විවිධ භාණ්ඩ හා සේවා', 'ප්‍රවාහන', 'ආපනශාලා හා හෝටල්', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම අඩුවී ඇත. 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. පසුගිය මාසය හා සසඳන කළ 'සෞඛ්‍ය' සහ 'සන්නිවේදන' කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020